# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 8 – Third Term Test - November 2019

**Time 1.20 hrs**

## Practical and technology skills

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

| | ලකුණු |
|---|---|
| ප්‍රායෝගික | |
| I කොටස | |
| II කොටස | |
| එකතුව | % |

### I කොටස

**1 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. ව්‍යාපෘති සිදු කිරීමේදී අප විසින් ප්‍රථමයෙන්ම සිදු කළ යුතු පියවර කුමක්ද?
   1. තීරණ ගැනීම  2. සැලසුම් කිරීම  3. පසු විපරම  4. ක්‍රියාත්මක කිරීම

2. අභියෝග ජය ගනිමින් ගෙවත්තක් සැකසීමේදී යොදා ගනු ලබන පාංශු සංරක්ෂණ ක්‍රමයකි
   1. උස් පාත්ති සකසා බෝග සිටුවීම  2. එකම කුලයේ බෝග එකිනෙකට ලංව සිටුවීම
   3. බෑවුමට ලම්භක ව වැටි ලෙස බෝග සිටුවීම  4. බදුන්ගත බෝග පමණක් සිටුවීම

3. ගෙවත්තක් සැලසුම් කරණයේදී තීරණ ගැනීමේදී අවම සැලකිල්ලක් දැක්විය යුතු කරුණ වන්නේ?
   1. ගෙවත්තේ විශාලත්වය තීරණය කිරීම  2. සරල තාක්ෂණික ක්‍රම අනුගමනය කිරීම
   3. ප්‍රදේශයට සුදුසු බෝග තෝරා ගැනීම  4. ලැබෙන අස්වනු ප්‍රමාණය මුලදී ම තීරණය කිරීම

4. කෘෂිකර්මාන්තය සඳහා ඍජුව ම දායකවන ජල ප්‍රභවය වන්නේ
   1. වැව්  2. පොකුණු  3. ජලාශ  4. වගුරු

5. ජලාශ්‍රිත ශාක භාවිතයට ගැනීම සම්බන්ධව වැරදි ප්‍රකාශය තෝරන්න
   1. කෙකටිය හා නීරමුල්ලියවලින් ව්‍යංජන සාදයි  2. කිරල, වෙල් ආතා ගෙඩිවලින් රසවත් බීම සාදයි
   3. සැල්විනියා පොහොරක් ලෙස යොදා ගනී  4. තුන්හිරියා, ගල්ලෑහැ බෑග් වියමනට ගත නොහැක

6. වෙළෙඳපොළ ප්‍රචාරණ මාධ්‍ය පිළිබඳව නිවරදි ප්‍රකාශය තෝරන්න
   1. පුවත් පත් හා අත් පත්‍රිකා දෘෂ්‍ය මාධ්‍ය වේ  2. චලන රූප, ප්‍රදර්ශන දෘෂ්‍ය මාධ්‍ය වේ
   3. රූපවාහිනී, ගුවන්විදුලිය ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය වේ  4. අත් පත්‍රිකා, අණ බෙර දෘෂ්‍ය මාධ්‍ය වේ

7. වෙළෙඳපොළ ඛණ්ඩනය කර ඇති ආකාරයට අයත් නොවන අවස්ථාව තෝරන්න
   1. ළමා ඇඳුම් වෙනම ස්ථානයක විකිණීමට තැබීම  2. පලතුරු කඩයක් පවත්වාගෙන යාම
   3. කාන්තා, ළමා සහ පිරිමි ලෙස සපත්තු වෙන්කර විකිණීම  4. ගමේ ග්‍රොසරියක් පවත්වාගෙන යාම

8. වෙළෙඳපොළ විමර්ශනාත්මකව බැලීමේ දී අවම දායකත්වයක් දරන්නේ
   1. ඉලක්කගත වෙළෙඳපොළ  2. පාරිභෝගික අවශ්‍යතා හා ක්‍රය ශක්තිය සැලකීම
   3. ජන වර්ගය හා වයස  4. භාණ්ඩ ප්‍රචාරණය හා බෙදා හැරීම සැලකීම

9. බෑවුම් සහිත භූමිවල සිදුවන පාංශු ඛාදනය වැළැක්වීමට ගතහැකි ප්‍රධාන ක්‍රියා මාර්ගයකි

1. බෑවුම පහළට කානු කැපීම
2. හෙල්මලු ආකාරයට බිම් සකසා බෝග වගා කිරීම
3. බෑවුම පහළ අතට පාත්ති සෑදීම
4. බෝග වගාවන් සඳහා රසායනික පොහොර භාවිතා කිරීම

10. භාණ්ඩයක මුලු පිරිවැය ලෙස සලකනු ලබන්නේ

1. සෘජු පිරිවැය + වක්‍ර පිරිවැය
2. අමුද්‍රව්‍ය වියදම + ශ්‍රම වියදම
3. සෘජු පිරිවැය + අමුද්‍රව්‍ය වියදම
4. ශ්‍රම වියදම + වක්‍ර පිරිවැය

**11 සිට 15 දක්වා ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණ ද වැරදිනම් X ලකුණ ද කොටුව තුළ යොදන්න.**

11. ඇඹුල්තියල් කිරීම සඳහා බලයා කෙලවල්ලා හුරුල්ලා වැනි මාළු භාවිතා කළ හැක

12. පරිපථයක ආරෝපන තාවකාලිකව ගබඩා කිරීම හා නිදහස් කිරීම සඳහා ප්‍රතිරෝධක (Resistors) භාවිතා කෙරේ

13. ඩයෝඩ මගින් විදුලිය එක් පසකට පමණක් ගමන් කරයි

14. අවකාශයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා සාර්ථක ව්‍යාපෘතියක් සිදු කිරීමේ දී සැලසුම් කිරීම අත්‍යාවශ්‍ය නොවේ.

15. අලෙවි ප්‍රවර්ධනයේ මූලිකාංග ලෙස සන්නිවේදනය, දිරි ගැන්වීම හා ආරාධනය කිරීම සිදු කරනු ලැබේ.

**16 සිට 20 දක්වා වරහන් තුළ ඇති <u>නිවැරදි ප්‍රකාශය යටින් ඉරක්</u> අඳින්න.**

16. ගොවිපොළ සතුන් ඇති කිරීමේ සියුම් ක්‍රමයේ දී ............................................ (ලාභය උපරිම කර ගැනීමට වැඩි ශ්‍රමයක් යෙදිය යුතුය / දිවා කාලයේදී සතුන් ආහාර සොයාගෙන කෑමට නිදහස් කරයි )

17. අඩ සියුම් ක්‍රමයට ගොවිපොළ සතුන් ඇති කිරීමේ දී සතුන් හට රාත්‍රී කාලයේ දී ............................................ (වාසස්ථාන සැපයීම අවශ්‍ය වේ / වාසස්ථාන සැපයීම අවශ්‍ය නොවේ)

18. පැපොල් අච්චාරු සෑදීමේ දී කපා බ්ලාන්ච් කර ගත් අමු පැපොල් කැබලි සමඟ ............................................ *(අබ කුඩු හා ලුණු සමග විනාකිරි / ලුණු හා ගොරකා කුඩු සමග විනාකිරි)* මිශ්‍ර කර ගනු ලැබේ.

19. පසු අස්වනු හානිය අවම කිරීමට ඇතැම් එළවලු හා පලතුරු නෙළීමේ වේලාව ඒවායේ ............................................ *(වර්ගය අනුව වෙනස් වේ / වර්ගය අනුව වෙනස් නොවේ.)*

20. පාපැදියක් නිසි පරිදි නඩත්තු කිරීමේ දී ඔබට එහි විවිධ ස්ථාන සඳහා ලිහිසි තෙල් යෙදීමට සිදුවේ. මේ සඳහා............................................ භාවිතයට ගත හැක.
*(එන්ජින් ඔයිල් {Engine Oil } / බ්‍රේක් ඔයිල් {Break Oil} )*

## II කොටස

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 6 බැගින් ලැබේ)

**ප්‍රශ්න ප්‍රශ්න 5කට (පහකට) පමණක් පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.**

**(1)** (I) සිරස් වගා ක්‍රම හා බඳුන්ගත වගාව බහුලව සිදු කිරීමට සිදුවන්නේ කුමන පාරිසරික තත්වයකද

.............................................................................................................................................

.............................................................................................................................................

(II) බෝග සිටුවීමේදී පළිබෝධ හානිය අවම කර ගැනීමට අනුගමනය කරන ක්‍රියාමාර්ග 2ක් ලියන්න

1. .............................................................................................................................................

2. .............................................................................................................................................

(III) පාසල් ගෙවත්තේ කටයුතු සිදු කිරීමේදී කාල කළමනාකරණය කළ හැකි ක්‍රම 2ක් ලියන්න

1. .............................................................................................................................................

2. .............................................................................................................................................

(2) (I) ගොවිපොළ සතුන් ඇති කිරීමේදී අඩු ම හා වැඩිම අවධානයක් යෙදිය යුතු ක්‍රම මොනවාද?

1. අඩුම අවධානය.............................................................................................................

2. වැඩි අවධානය.............................................................................................................

(II) ශ්‍රී ලංකාවේ ගැමි ගෙදරක කුකුළන් ඇතිකිරීමට භාවිතා කළ හැකි සුදුසු ක්‍රමයක් ලියන්න

.............................................................................................................................................

(III) ගොවිපොළ අපද්‍රව්‍ය ස්වභාවික ජලයට එකතුවීමෙන් සිදුවන පාරිසරික ව්‍යසන (උවදුරු) 2ක් සඳහන් කරන්න

1. .............................................................................................................................................

2. .............................................................................................................................................

(3) වරහන් තුළ දී ඇති වචන සුදුසු පරිදි යොදා පහත සඳහන් ඡේදය සම්පූර්ණ කරන්න

**(ජීවාණුහරණය / පීඩන උදුන /අධිශීතකරණ / ජෛව /භෞතික /පැස්ටරීකරණය)**

ආහාර වර්ග නරක්වීම කෙරෙහි විවිධ සාධක බලපාන අතර, කැපීම්, සීරීම්, තැලීම් වැනි යාන්ත්‍රික හානි ආහාර නරක්වීමේ ........................................ සාධක ලෙසත්, විවිධ සතුන්ගෙන් ආහාරවලට සිදුවන හානි ........................................ සාධක ලෙසත් හැඳින්වේ. ආහාර සුරක්ෂිත කිරීම සඳහා විවිධ ක්‍රම උපයෝගී කර ගන්නා අතර, කිරි 63 $^0C$ මිනිත්තු 30ක් තැබීමෙන් ........................................ කරනු ලැබේ. ටින් කරන ලද ආහාර 121 $^0C$ක උෂ්ණත්වයකට රත් කර සියලු ක්ෂුද්‍ර ජීවීන් විනාශ කිරීම ........................................ ලෙස හැඳින්වේ. නිවසේදී ආහාර ජීවානුහරණය කිරීම සඳහා ........................................භාවිතා කරන අතර, 4 $^0C$ පමණ පහළ උෂ්ණත්වයේ මස් මාළු ආදිය ගබඩා කිරීම සඳහා ........................................ භාවිතා කරයි.

(4) (II) බෝග අස්වනු නෙළීමේ දී පසු අස්වනු හානි සිදුවන ආකාර 2ක් ලියන්න

1. ..........................................................................................

2. ..........................................................................................

(II) එළවළු ප්‍රවාහනය කිරීමේ දී පසු අස්වනු හානිය අවම කරන අයුරු විස්තර කරන්න

..........................................................................................

..........................................................................................

..........................................................................................

(III) අස්වන්න නෙළා ගැනීමේ දී, මේරීමට ප්‍රථම නෙළා ගතයුතු හා හොඳින් මේරීමෙන් පසුව නෙළාගතයුතු බෝග වර්ග 2 බැගින් සඳහන් කරන්න.

| | මේරීමට ප්‍රථම නෙළා ගතයුතු බෝග | මේරීමෙන් පසුව නෙළාගතයුතු බෝග |
|---|---|---|
| 1 | | |
| 2 | | |

(5) (I) අප භාවිතා කරන ගෘහ උපකරණ නඩත්තු කිරීමට සිදුවන හේතු කෙටියෙන් පහදන්න

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

(II) පාපැදියක ලිහිසි තෙල් හා ග්‍රීස් යෙදිය යුතු ස්ථාන දෙක බැගින් සඳහන් කරන්න

| | ලිහිසි තෙල් යෙදිය යුතු ස්ථාන . | ග්‍රීස් යෙදිය යුතු ස්ථායක් |
|---|---|---|
| 1 | | |
| 2 | | |

(III) ලෝහ සහ ලී භාණ්ඩවල මතුපිට පෘෂ්ඨ අලුත්වැඩියාවට යොදා ගන්නා පහත සඳහන් ද්‍රව්‍යවලට උදාහරණ 2 බැගින් සඳහන් කරන්න.

| | ලෝහ පෘෂ්ඨ සඳහා පෙර නිම්හම් ද්‍රව්‍ය | දැව පෘෂ්ඨ සඳහා පසු නිම්හම් ද්‍රව්‍ය |
|---|---|---|
| 1 | | |
| 2 | | |

(6) (i) නිවසේ ඉඩකඩ කාර්යක්ෂමව භාවිතා කිරීමේ දී පහත සඳහන් ක්‍රමවල වාසිය බැගින් සඳහන් කරන්න

a. උපකරණ හකුළා තැබීමේ උපක්‍රමය

..............................................................................................................................

..............................................................................................................................

b. උපකරණවල කුටීර වෙන් කිරීමේ උපක්‍රම

..............................................................................................................................

..............................................................................................................................

(ii) යම්කිසි භාණ්ඩයක් සඳහා අලෙවිය ප්‍රවර්ධනය කරන විට සැලකිය යුතු මූලිකාංග තුන සඳහන් කරන්න

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

3. ..............................................................................................................................

(iii) වෙළෙඳපොළ හිදැසක් ලෙස ඔබ අදහස්කරන්නේ කුමක්ද?

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(7) (i) පාසලක් අසල වෙළෙඳසැලක් ආරම්භ කිරීමේ දී ඉලක්කගත වෙළෙඳ පොළක් (Target Market) යන සංකල්පය යොදා ගැනීමේ දී අනුගමනය කළයුතු විශේෂ ලක්ෂණ සඳහන් කරන්න

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(ii) යම් ව්‍යපාරිකයෙක් දියුණු අදියරකට පැමිණි පසුව ඔහු සතු සමාජ වගකීම කෙටියෙන් සඳහන් කරන්න

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

(iii) භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ දී නිෂ්පාදන පිරිවැය අඩු කර ගත හැකි ක්‍රම 2ක් සඳහන් කරන්න

..............................................................................................................................

..............................................................................................................................